# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 2067/15 - 2018 අප්‍රේල් මස 19 වැනි බ්‍රහස්පතින්දා - 2018.04.19**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්.ඩී.බී. 21/1998 (X)

**1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත**

25අ වගන්තිය යටතේ වූ නියමය

1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 25අ වගන්තිය මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, උසස් අධ්‍යාපන අමාත්‍ය කබීර් හෂීම් වන මා විසින්, 2007 අංක 7 දරන සමාගම් පනත යටතේ ශ්‍රී ලංකාවේ සංස්ථාගත කර ඇති සමාගමක් වන අංක පී. වී. 17745 දරන කලම්බු ඉන්ටනැෂනල් නෝටිකල් ඇන්ඩ් ඉංජිනියරින් කොලේජ් (ප්‍රයිවට්) ලිමිටඩ් ආයතනය සම්බන්ධයෙන් ඉහත කී විශ්වවිද්‍යාල පනතේ 70ඇ වගන්තිය යටතේ වාර්තාවක් ලබාගැනීමෙන් පසුව, මෙම නියමය මගින්, එකී පනත යටතේ සාදනු ලැබූ 2018 ජනවාරි මස 11 වන දින අංක 2053/39 දරන *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* පළකරන ලද නියමයේ II වන උපලේඛනයේ I වන තීරයේ දැක්වෙන ''භෞතීය විද්‍යා පිළිබඳ අධ්‍යාපනවේදී ගෞරව'' යන සටහනට හා එහි II වන තීරයේ අනුරූප සටහනට ඉක්බිතිවම මෙහි II වන උපලේඛනයේ පිළිවෙළින් I වන සහ II වන තීරයන්හි නිශ්චිතව සඳහන් සටහන්, මෙහි I වන උපලේඛනයේ නිශ්චිතව සඳහන් කොන්දේසිවලට යටත් ව එකතුකිරීම මගින් එම නියමයේ උපලේඛනය මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

කබීර් හෂීම්,<br>
උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍ය.

2018 අප්‍රේල් මස 18 වැනි දින.<br>
කොළඹ දී ය.

I වන උපලේඛනය

***කොන්දේසි***

කලම්බු ඉන්ටනැෂනල් නෝටිකල් ඇන්ඩ් ඉංජිනියරින් කොලේජ් (ප්‍රයිවට්) ලිමිටඩ් ආයතනය විසින් මෙහි II වන උපලේඛනයේ නිශ්චිතව සඳහන්ව ඇති උපාධි වැඩසටහන් සඳහා සිසුන් ඇතුළත් කර ගැනීමේ දී :-

*I වන උපලේඛනය - (සම්බන්ධිතයි)*

(අ) යාන්ත්‍රික ඉංජිනේරු විද්‍යාව පිළිබඳ ඉංජිනේරු විද්‍යාවේදී ගෞරව උපාධිය, මෝටර් කාර්මික ඉංජිනේරු විද්‍යාව පිළිබඳ ඉංජිනේරු විද්‍යාවේදී ගෞරව උපාධිය, විද්‍යුත් හා විදුලි සංදේශ ඉංජිනේරු විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී ගෞරව උපාධිය සහ සිවිල් ඉංජිනේරු විද්‍යාව පිළිබඳ ඉංජිනේරු විද්‍යාවේදී ගෞරව උපාධිය සම්බන්ධයෙන්, අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේ භෞතීය විද්‍යා විෂය ධාරාවෙන් 'S' සාමාර්ථ තුනක් (03) එකවර ලබා තිබීම යන අවම ඇතුළත් කරගැනීමේ සුදුසුකම හෝ ඒ හා සමාන සුදුසුකමක් ලබා තිබීම යන්නට අනුකූල විය යුතු ය :-

(ආ) ජෛව විද්‍යා පිළිබඳ අධ්‍යයනවේදී ගෞරව උපාධිය සම්බන්ධයෙන්, අධ්‍යාපන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේ දී ජීව විද්‍යාව, රසායන විද්‍යාව, භෞතික විද්‍යාව සහ කෘෂිකර්මය යන විෂයන් අතුරින් 'S' සාමාර්ථ තුනක් (03) එකවර ලබා තිබීම යන අවම ඇතුළත් කර ගැනීමේ සුදුසුකම හෝ ඒ හා සමාන සුදුසුකමක් ලබා තිබීම යන්නට අනුකූල විය යුතු ය.

(ඇ) තොරතුරු තාක්ෂණය පිළිබඳ අධ්‍යාපනවේදී ගෞරව උපාධිය සම්බන්ධයෙන්, අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේ කවර හෝ විෂය ධාරාවකින් 'S' සාමර්ථ තුනක් (03) එකවර ලබාතිබීම යන අවම ඇතුළත් කර ගැනීමේ සුදුසුකම හෝ ඒ හා සමාන සුදුසුකමක් ලබා තිබීම යන්නට අනුකූල විය යුතු ය.

**II වන උපලේඛනය**

| I වන තීරය<br>උපාධිය | II වන තීරය<br>උපාධිය සඳහා කෙටි යෙදුම |
|---|---|
| යාන්ත්‍රික ඉංජිනේරු විද්‍යාව පිළිබඳ ඉංජිනේරු විද්‍යාවේදී ගෞරව | බීඑස්සී ගෞරව (ඉංජිනේරු) (යාන්ත්‍රික ඉංජිනේරු) |
| මෝටර් කාර්මික ඉංජිනේරු විද්‍යාව පිළිබඳ ඉංජිනේරු විද්‍යාවේදී ගෞරව | බීඑස්සී ගෞරව (ඉංජිනේරු) (මෝටර් කාර්මික ඉංජිනේරු) |
| විද්‍යුත් හා විදුලි සංදේශ ඉංජිනේරු විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී ගෞරව | බීඑස්සී ගෞරව (ඉංජිනේරු) (විද්‍යුත් හා විදුලි සංදේශ ඉංජිනේරු) |
| සිවිල් ඉංජිනේරු විද්‍යාව පිළිබඳ ඉංජිනේරු විද්‍යාවේදී ගෞරව | බීඑස්සී ගෞරව (ඉංජිනේරු) (සිවිල් ඉංජිනේරු) |
| ජෛව විද්‍යා පිළිබඳ අධ්‍යාපනවේදී ගෞරව | බීඒඩ් ගෞරව (ජෛව විද්‍යාව) |
| තොරතුරු තාක්ෂණය පිළිබඳ අධ්‍යාපනවේදී ගෞරව | බීඒඩ් ගෞරව (තොරතුරු තාක්ෂණ) |

05 - 39

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.